ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

දිනය **2014 දෙසැම්බර් 30**

**වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අදාළ විශේෂ පොලී යෝජනා ක්‍රමය**

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඉහළ පොලී ආදායමක් ලබාදීමේ අරමුණින්, සියලුම බලපත්‍රලාභී බැංකුවල ස්ථාවර තැන්පතු පවත්වාගෙන යනු ලබන, වයස අවුරුදු 60 ට වැඩි පුරවැසියන් සතු තැන්පතු සඳහා සියයට 12 ක විශේෂ වාර්ෂික පොලී යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට 2015 අයවැය මගින් යෝජනා විය.

එම යෝජනාවට අනුව යමින්, 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී බැංකුවල වයස අවුරුදු 60 ට වැඩි තැන්පතුකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන රුපියල් 2,500,000/- දක්වා රුපියල් ස්ථාවර තැන්පතු, රුපියල් 300,000/- ක උපරිම වාර්ෂික පොලී ආදායමක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

ඒ අනුව, මෙම යෝජනා ක්‍රමයට සහභාගි වන බැංකු වන සියලුම බලපත්‍රලාභී බැංකු වෙත පහත දැක්වෙන මෙහෙයුම් උපදෙස් නිකුත් කර ඇත.

- 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ස්ථාවර තැන්පතු ගිණුම් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම බලපත්‍රලාභී බැංකු මෙම විශේෂ පොලී යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවිය යුතුය.

- මෙම යෝජනා ක්‍රමයට සහභාගි වන පෞද්ගලික බැංකු, මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවෙහි උපදෙස් යටතේ, රජයෙහි සංවර්ධන කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙම යෝජනා ක්‍රමයට සහභාගි වන සියලුම බැංකු, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන රුපියල් 2,500,000/- දක්වා තැන්පතු සඳහා වසරකට රුපියල් 300,000/- උපරිම පොලී ආදායමකට යටත්ව, සියයට 12 ක වාර්ෂික පොලී අනුපාතයක් ගෙවිය යුතුය.

- මීට අනුකූලව, මෙම යෝජනා ක්‍රමය යටතේ දැරීමට සිදුවන අතිරේක පොලී පිරිවැය ආවරණය කිරීම සඳහා, මෙම යෝජනා ක්‍රමයට සහභාගි වන බැංකු වෙත, රජය මගින් නිකුත් කරනු ලබන, සියයට 12 ක වාර්ෂික පොලී අනුපාතිකයක් සහිත විශේෂ බැඳුම්කර ලබාදෙනු ඇත.

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින්, මෙම තැන්පතු මගින් උපයනු ලබන පොලී ආදායම, ආදායම් බදු වලින් නිදහස් කෙරේ.